**ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ |
|---|---|---|

ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 11 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**02. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,513.50 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 1281.26 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 232.24 ක් හෙවත් සියයට 15.34 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 688.70 | 678.72 | 9.98 | 1.45 |
| මූලධන | 824.80 | 602.54 | 222.26 | 26.95 |
| එකතුව | 1513.50 | 1281.26 | 232.24 | 15.34 |

(ආ) වෙනත් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යංශ 20 ක් හා දෙපාර්තමේන්තු 12 ක් විසින් එකතුව රු. මිලියන 4,165.3 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 4,008.5 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු. මිලියන 156.8 ක් හෙවත් සියයට 3.76 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

## 2.2 අත්තිකාරම් ගිණුම

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 25501 යටතේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 47.39 | 39.29 | 34.00 | 38.50 | 200.00 | 155.53 |

## 2.3 අග්‍රිම ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ අංක 70002/0000/00/0302/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 574.3 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ අංක 6003/0000/00/0001/000 දරන පොදු තැන්පත් ගිණුමේ රු.මිලියන 10.00 ක හර ශේෂයක් පැවැතුණි. තවත් ගිණුම් 08 ක එදිනට බැර ශේෂවල එකතුව රු.මිලියන 543.48 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/000/0001/0057/000 | 32.07 |
| 6000/0000/000/0017/0006/000 | 221.47 |
| 6000/0000/000/0013/0046/000 | 82.24 |
| 6000/0000/000/0016/0026/000 | 196.69 |
| 6000/0000/000/0018/0006/000 | 3.59 |
| 6000/0000/000/0019/0001/000 | 3.32 |
| 6000/0000/000/0020/0006/000 | 4.06 |
| 6000/0000/000/0002/0075/000 | 0.04 |
| එකතුව | 543.48 |

**2.5 විගණන නිරීක්ෂණය**

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) |
| (ඈ) | ණය සහ අත්තිකාරම් ලේඛනය | 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 09 (1) ඡේදය |

**3.2 විසර්ජන ගිණුම**

**-------------------**

**3.2.1 අයවැය විචලනය**

**--------------------**

වැය විෂයයන් 03ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 28 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන**

**------------------------------------------------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) අමාත්‍යාංශ 04 ක් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් අදාළ කාර්යයන් සඳහා උපයෝජනයන් කළ පසු ඉතිරිය සියයට 33 ක සිට සියයට 44 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ආ) උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් 2015 අප්‍රේල් 28 දින විදාතා මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කර්යාල වෙත රු.3,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. අදාළ මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමෙන් තොරව රු.1,588,938 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(ඇ) සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් පුවක්පිටිය ජයවිරු සමාධි ආයතනයේ මුළුතැන්ගෙය ඉදිකිරීමේ කටයුතු සඳහා රු.12,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම ප්‍රතිපාදනවලින් අදාළ කාර්යය ඉටු නොකර සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

**3.3 පොදු තැන්පත් ගිණුම**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 02ක් ඉක්මවූ රු.3,490,894ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් 2014 හා 2015 වර්ෂවලදී ලැබී තිබුණු රු. 705,227 ක් අදාළ කාර්යයන් නිමවා වියදම් පියවීමට හෝ ඉතිරිය අදාළ ආයතන වෙත ගෙවීමට හෝ කටයුතු නොකර එම මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**---------------------------------------------------------------------**

විෂය අංක 25501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දින වන විට රු.5,012,321 ක් වූ හිඟහිටි ණය ශේෂයෙන් රු.3,793,447 ක ණය ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 21 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්. එම ශේෂ අයකර ගැනීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත්, කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව ණය ශේෂය රු.155,530,951 ක් වී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව ණය ශේෂය රු.154,350,069 ක් වී තිබුණි. ඒ අනුව රු.1,180,882 ක වෙනසක් අනාවරණය වී තිබුණත්, එයින් රු.1,197,132 ක් සම්බන්ධයෙන් සැසඳීමක් කර නිවැරදි කිරීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි.

**3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---

**3.5.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුනි 14 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.5.2 අභ්‍යන්තර විගණනය**

---

අභ්‍යන්තර විගණන ඒකකයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ ක්‍රියාත්මක වුවද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3.6** බේරුම් නොකළ බැරකම්

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 01 කට අඩු කාලයක සිට පැවත එමින් තිබුණු බැරකම්වල එකතුව රු. 4,517,262 ක් විය. වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් උපයෝජනය කළ පසු ඉතිරිය රු.325,052 ක් වී තිබුණත්, එම ඉතිරිය රු.2,020,029 කින් ඉක්මවා රු.2,345,081 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.7 දේශීය මූල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

---

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

---

දින 100 විශේෂ සංවර්ධන වැඩසටහනට සමගාමීව දොරින් දොරට ගමින් ගම ගම් 1500 ක් නගා සිටුවීමේ වැඩසටහන යටතේ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබුණු ව්‍යාපෘති 03 ක් භූමිය සම්බන්ධයෙන් ගැටළු මතු වීම නිසා එම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි. එසේම එකතුව රු.2,035,394 ක් වූ ව්‍යාපෘති 2 ක් කාලය ප්‍රමාණවත් නොවීම නිසා ගිවිසුම් අත්සන් කිරීමට කොන්ත්‍රාත්කරු ප්‍රතික්ෂේප කිරීම නිසා එම ව්‍යාපෘති දෙක ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ගිවිසුම්වලට එළඹ තිබුණත්, වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘති

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබුණු එකතුව රු.5,099,321 ක් වූ ඇස්තමේන්තු පිරිවැයක් යටතේ වූ ව්‍යාපෘති 05 ක් සඳහා රු.4,410,775 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. කාලය ප්‍රමාණවත් නොවීම, කොන්ත්‍රාත්කරු විසින් වැඩ ආරම්භ නොකිරීම හා ස්ථාන සම්බන්ධයෙන් විරෝධතා මතුවීම වැනි හේතු නිසා ව්‍යාපෘති 05 ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත්, කොන්ත්‍රාත්කරුවන් ගිවිසුමට අනුකූලව අවසන් නොකිරීම නිසා එම කොන්ත්‍රාත්කරුවන් අසාධු ලේඛන ගත කිරීම නිසා එම ව්‍යාපෘති නිම නොකර අත්හැර තිබුණි

| ව්‍යපෘති අංකය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත වටිනාකම |
|---|---|---|
| | | රු. |
| HDP/KES/01 | පුබුදු මාවත කාණු පද්ධතියේ මීටර් 300ක් පමණ දුර ඇති බැම්ම සකස් කර කාණු පද්ධතිය සංවර්ධනය කිරීම. | 1,051,640 |
| HDP/KES/90 | මඩපාත ශ්‍රී ශෛලතලාරාම පුරාණ විහාරස්ථානයේ ශ්‍රී ශීලානන්ද දහම් පාසල් ගොඩනැගිල්ලේ පළමු මහල සංවර්ධනය කිරීම. | 1,648,662 |

## 3.8 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු කැබ් රථයක් වර්ෂ 10කට වැඩි කාලයක සිට අනතුරකට ලක්වීමෙන් හානියට පත් වී තිබුණි. එම අලාභහානිය මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අයකර ගැනිමට හෝ කපා හැරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 05 කට අඩු කාලයක පැවැත එන රු.92,641,003 ක් හා වර්ෂ 5 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන රු.10,680 ක් වූ අලාභහානි අවස්ථා 05 කට අදාළ හානි හා පාඩු සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමේ දක්වා තිබුණි. අලාභහානි සම්බන්ධයෙන් 2016 අගෝස්තු 30 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

## 3.9 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 දෙසැම්බර් 31 දින වන විට නොගෙවූ වැඩිහිටි ජීවනාධාර රු.64,000 ක්ද, නොගෙවූ ආධාර රු.37,000ක් ද, නොගෙවූ සමෘද්ධි අධිකාරී දීමනා රු.32,300 ක්ද, නොගෙවූ විශ්‍රාම වැටුප් රු.329,175 ක් හා මහින්ද චින්තන වැඩ සටහනෙහි නොගෙවූ තැන්පතු රු.48,000 ක් වශයෙන් එකතුව රු.510,479 ක් අදාළ ආයතන වෙත ආපසු ගෙවීමට කටයුතු නොකර පොදු තැන්පත් ලෙස රඳවා තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2011 වර්ෂයේ තැන්පත් කරන ලද තෙවන පාර්ශව තැන්පතු රු.214,000 ක් හා 2012 වර්ෂයේ රැඳවුම් තැන්පතු රු.10,000 ක්, 2013 වර්ෂයේ රැඳවුම් තැන්පතු රු.104,774 ක් වශයෙන් එකතුව රු.328,774 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 50 | 46 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 27 | 19 | 08 |
| (iii) | ද්විතීයික මට්ටම | 1,603 | 1,347 | 256 |
| (iv) | ප්‍රාථමික මට්ටම් | 133 | 123 | 10 |
| | එකතුව | 1,813 | 1,535 | 278 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 278 ක් පැවතී තිබුණත්, 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම අනුව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණත්, එම ඉතිරියන් කෙරෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම බලපා නොතිබුණි. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය අධි ඇස්තමේන්තු කිරීමක් විගණනයේදී නිරීක්ෂණය විය.